# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2281/40 - 2022 මැයි මස 27 වැනි සිකුරාදා - 2022.05.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

2022/2023/2024 තෙවර්ෂය සඳහා ජනමාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීම - (සංශෝධන)

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව - 2022/2023/2024 තෙවර්ෂය සඳහා ජනමාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීම ශීර්ෂය යටතේ අංක 2259/12 හා 2021 දෙසැම්බර් 21 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නිවේදනයේ මතු දැක්වෙන වගන්ති පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

**01. මූලික නිර්ණායක හා අවශ්‍ය ලිපි ලේඛන**

(ii) පිළිගත් මාධ්‍ය ආයතනයක කොන්ත්‍රාත් පදනම මත සේවය කරන ජනමාධ්‍යවේදීන් සඳහා නිකුත් කරන මාධ්‍ය හැඳුනුම්පත් 2022 වසර සඳහා පමණක් වලංගු වේ. එම හැඳුනුම්පත්වල වලංගු කාලය 2022 දෙසැම්බර් මස 31 අවසන් වේ.

(x) වෙබ් අඩවි සඳහා නිකුත් කරන මාධ්‍ය හැඳුනුම්පත් 2022/2023 වසර දෙක සඳහා පමණක් වලංගු වේ. එම හැඳුනුම්පත් වල වලංගු කාලය 2023 දෙසැම්බර් මස 31 අවසන් වේ.

**02. මාධ්‍ය හැඳුනුම්පත් වර්ගීකරණය - මූලික නිර්ණායක හා අවශ්‍ය ලිපි ලේඛන**

(ii) ප්‍රාදේශීය මාධ්‍යවේදීන් (Provincial Journalist)
ප්‍රාදේශීය මාධ්‍යවේදීන් සඳහා නිකුත් කරන මාධ්‍ය හැඳුනුම්පත් 2022/2023 වසර දෙක සඳහා පමණක් වලංගු වේ. එම හැඳුනුම්පත්වල වලංගු කාලය 2023 දෙසැම්බර් මස 31 අවසන් වේ.

(vii) රාජ්‍ය මාධ්‍ය නිලධාරීන් (Media Official)
රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු ඇතුළු රජයේ ව්‍යවස්ථාපිත ආයතනවල මාධ්‍ය තනතුරු දරන්නන් සඳහා නිකුත් කරන මාධ්‍ය හැඳුනුම්පත 2022 වසර සඳහා පමණක් වලංගු වේ. එම හැඳුනුම්පත්වල වලංගු කාලය 2022 දෙසැම්බර් මස 31 අවසන් වේ.

**මොහාන් සමරනායක,**
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්,

EOG 05 - 0143


1A - G 36829 — 08 (2022/05)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.